සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

Learning Resource Centre
De Mazenod College
Kandana

**වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)**
**Year End Evaluation - 2024 (2025)**

№ 011421

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01යි |

නම / பெயர் / Name ..................................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාන්න.

1. සර්ව කෝමල රාගයකි
   i. කාෆි  ii. යමන්  iii. බිලාවල්  iv. භෛරවී

2. නි̣ධ̣නි̣රි ස , නි̣රි ග රි ස යනාදී වශයෙන් ස්වර යෙදෙන රාගය වන්නේ
   i. බිලාවල්  ii. භෛරවී  iii. යමන්  iv. කාෆි

3. රාගයකට අදාළ ස්වර අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන්
   i. රාගයේ ස්වර හැසිරවීම පිළිබඳ අවබෝධය ලබයි.
   ii. රාග ඥානය, ස්වර ඥානය වර්ධනය වීම හා කටහඬ පුහුණුව ලබයි.
   iii. අලංකාර ලෙස ස්වර ගායන හැකියාව ලබයි.
   iv. මධ්‍යලය ගීත ගායනය පහසු කරවයි.

4. භෛරවී රාගයට අනුව නිර්මාණය වූ ස්වර අභ්‍යාස කොටසක් පහත දැක්වේ.
   ස ග රි ග , රි ම ග ම , ....................... මෙම ස්වර අභ්‍යාසයේ මීළඟ ස්වර පාදය වනුයේ
   i. ග ම ප ම  ii. ග ප ම ප  iii. ග ප ම ග  iv. ම ධ ප ධ

5. ''එන්න මදනලේ, කවුරුදෝ අර කවුළුවෙන්'' යන රාගාශ්‍රිත සරල ගීත සඳහා පාදක වූ රාගය වන්නේ
   i. කාෆි  ii. බිලාවල්  iii. භෛරවී  iv. භූපාලි

6. භූපාලි රාගයේ විශේෂ ලක්ෂණයකි.
   i. ග නි කෝමලව යෙදේ.  ii. ම , නි වර්ජිත වේ.
   iii. විකෘති ස්වර එකක් පමණක් යෙදේ.  iv. ස්වර 07 ම යෙදේ.

7. ''නි ධ - ප | ම′ ප ග ම | ප - - - | ප ම′ ග රි |'' යන ස්වර පාදය
   i. යමන් රාගයේ මධ්‍යලය ගීතයේ පළමු පාදයයි.
   ii. භෛරවී රාගයේ සර්ගම් ගීතයේ පළමු පාදයයි.
   iii. යමන් රාගයේ සර්ගම් ගීතයේ පළමු පාදයයි.
   iv. භෛරවී රාගයේ මධ්‍යලය ගීතයේ පළමු පාදයයි.

8. සරල ගීතයක එක් පේළියක් දෙවරක් වාදනය කළ යුතු බව හැඟවෙන සංකේතය වන්නේ
   i. $  ii. #  iii. [[ ]]  iv. %

9. සරල ගීතයක් වඩාත් අලංකරණය කර ගැනීම සඳහා යොදා ගන්නේ
   i. Counter Parts
   ii. Repetition Marks
   iii. Notation
   iv. Sign to Sign

10. ස ප ප | ප ප ම | ප සි නි | ර් ස් - | යන ස්වර පාදයට අදාළ Time Signature වන්නේ
   i. 3/4
   ii. 4/4
   iii. 5/8
   iv. 6/8

11. සමග්‍රහයෙන් ගැයෙන ගී පාදයකි
   i. හෙළ ජාතික අභිමානේ
   ii. අම්මා සඳකි
   iii. අයන්න කියන්න
   iv. ඉරෙන් හඳෙන්

12. ග්‍රැමෆෝන් තැටි යුගයේ ගායකයකු නොවන්නේ
   i. ඇනී බොතේජු
   ii. රූපසිංහ මාස්ටර්
   iii. එඩී ජයමාන්න
   iv. කරුණාරත්න දිවුල්ගනේ

13. සුනිල් ශාන්ත මහතා විසින් ගායනා කරන ලද ගීතයකි
   i. එන්ඩද මැණිකේ මමත් දියඹට
   ii. ඇසේ මධුර ජීවනයේ ගීතා
   iii. වරෙන් හීං සැරේ රිදී වළාවේ
   iv. අක්කේ අක්කේ අර බලන්නකෝ

14. ගුවන් විදුලි සරල ගීතයට අඩිතාලම සැකසූ සංගීතඥයින් දෙදෙනෙකි
   i. ඩබ්. ඩී. අමරදේව - ආර්. ඒ. චන්ද්‍රසේන
   ii. සූර්ය ශංකර් මොල්ලිගොඩ - ආනන්ද සමරකෝන්
   iii. සුනිල් ශාන්ත - ඩබ්. ඩී. අමරදේව
   iv. ආනන්ද සමරකෝන් - සුනිල් ශාන්ත

15. මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීතවල දැකිය හැකි විශේෂ ලක්ෂණයකි
   i. සංගීත භාණ්ඩ විශාල සංඛ්‍යාවක් භාවිත කිරීම.
   ii. කෙටි හා අතුරු සංගීත ඛණ්ඩ දක්නට ලැබීම.
   iii. කටහඬට මුල්තැනක් දීම.
   iv. පෙර වාදන හා අතුරු වාදන සඳහා ප්‍රමුඛත්වය ලැබීම.

16. කපිරිඤ්ඤා ගීත ඇසුරින් නිර්මාණය වූ සරල ගීතයකි
   i. මී වදයකි ජීවිතේ
   ii. මල් සරා බැල්ම හෙලා
   iii. ගමට කලින් හිරු
   iv. දෑඩි කළ මාතා

17. සමුද්‍රඝෝෂ වීරිතට ගැයෙන ගී පාදයකි
   i. මන් මත් කරවන දන මුළු දෙරණා
   ii. පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
   iii. එපුර සත සිත තොස හෙලා
   iv. සඳවා සුදු වැලි පිවිතුරු

18. ගුත්තිල කාව්‍යයේ එන දොළොස් මත් පැදියකි
   i. රූ රැසේ අඳිනා ලෙසේ අත්
   ii. මන්මත් කරවන දන මුළු දෙරණා
   iii. ඇතුලට වැද ගෙය ඇවිලෙන ගින්නේ
   iv. රැගත් සුරා පිරූ විතින්

19. ආඝාතාත්මක මෙහෙ ගීයකි
   i. දුම්බර කන්ද පාමුල මිනිරන් පතලේ
   ii. වෙල්යායක ගොන් දෙන්නෙක් කකා උනි
   iii. රන් දෑ කැති ගෙන නිති සැරසෙනවා
   iv. තණ්ඩලේ දෙන්නා දෙපොලේ

- අංක 20 සිට 24 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප භාවිත කරන්න.



A



B



C



D

20. ඉහත රූප සටහන් වලට අයත් තාල වාදන භාණ්ඩ පිළිවෙලින්
   i. තබ්ලාව, මද්දලය, ගැටබෙරය, පහතරට බෙරය
   ii. තබ්ලාව, පහතරට බෙරය, මද්දලය, ගැටබෙරය
   iii. තබ්ලාව, මද්දලය, පහතරට බෙරය, ගැටබෙරය
   iv. තබ්ලාව, ගැටබෙරය, මද්දලය, පහතරට බෙරය

21. නූර්ති සංගීතයේ දී ප්‍රධාන තාල වාදන භාණ්ඩය ලෙස භාවිතා කළේ
   i. මද්දලයයි. ii. තබ්ලාවයි. iii. පහතරට බෙරයයි. iv. ගැටබෙරයයි.

22. මනමේ, සිංහබාහු වැනි නව නාට්‍යවල සංගීතයේදී භාවිත වන තාල වාද්‍ය භාණ්ඩය වනුයේ
   i. තබ්ලාවයි. ii. ගැටබෙරයයි. iii. මද්දලයයි. iv. පහතරට බෙරයයි.

23. නාඩගම් සංගීතයේදී අඩුතාල හා වැඩි තාල වශයෙන් වාදනය කරන වාද්‍ය භාණ්ඩයකි
   i. මද්දලය ii. තබ්ලාව iii. ගැටබෙරය iv. පහතරට බෙරය

24. "දොංජි / ජිගත" යන තාල පදය වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩයකි
   i. තබ්ලාව ii. ගැටබෙරය iii. මද්දලය iv. පහතරට බෙරය

25. "දුල් නිමල් සිසි සේ" නාඩගම් ගීය ඇසුරින් නිර්මිත නවනාට්‍ය ගීය වන්නේ
   i. නන් සිරිනි වොරැඩි ii. ලප නොමවන් සඳ
   iii. ප්‍රේමයෙන් මන රංජිත වේ iv. දස දෙස ඉන්ද්‍රා

26. සිංහල නව නාට්‍ය කලාවේ පුරෝගාමී නිර්මාණකරුවා වනුයේ
   i. හෙන්රි ජයසේනයන් ii. පුණ්‍යසේන ගුණසිංහයන්
   iii. එදිරිවීර සරච්චන්ද්‍රයන් iv. දයානන්ද ගුණවර්ධනයන්

27. ජන සංගීතය පිළිබඳ පර්යේෂණාත්මක කෘතියක් වන "හෙළ ගී මඟ" නම් ග්‍රන්ථයේ කතුවරයා වන්නේ
   i. සී. ද එස්. කුලතිලක මහතාය ii. ඩබ්. බී. මකුලොළුව මහතාය
   iii. රෝහණ බැද්දගේ මහතාය iv. ලයනල් රන්වල මහතාය

28. සී. ද එස්. කුලතිලක මහතා ගැමි ගී ආශ්‍රයෙන් නිර්මාණය කරන ලද සරල ගීයකි
   i. ආදරයේ උල්පත වූ අම්මා ii. සිරි සරු සාර කෙතේ
   iii. මේ අවුරුදු කාලේ iv. දැකට වළලු මල් මුතුවැල් මාල පොටයි

29. පැල් ගී, පාරු ගී, ගොයම් ගී, නෙළුම් ගී යන ගැමි ගී හැඳින්විය හැකි පොදු කියමනකි
i. ගී වර්ග හතරම මෙහෙ ගී වලට අයත් වේ.
ii. ගී වර්ග හතරම ආඝාතාත්මකය.
iii. ගී වර්ග හතරම අනාඝාතාත්මකය.
iv. ගී වර්ග හතරම කෙත හා බැඳි මෙහෙ ගී ය.

30. ෂඩ්ජයේ කම්පන වාර සංඛ්‍යානය 256 ක් නම් උච්ච ෂඩ්ජයට හිමි කම්පන වාර සංඛ්‍යානය
i. 128 Hz  ii. 288 Hz  iii. 512 Hz  iv. 320 Hz

31. භෛරවී රාගය ඇසුරින් තනු නිර්මාණය කර ඇති හින්දි චිත්‍රපට ගීතයකි
i. තු ගංගා කී මෞජ මෛ
ii. තෙරේ මේරේ
iii. ජනක් ජනක් පායල් භාජේ
iv. තෙරී බිඳියාරේ

32. වැලපුම් ගී ආශ්‍රිතව තනු නිර්මාණය කරන ලද මව් ගුණ ගීතයකි
i. දුනුකෙයියා මලක් වගේ
ii. ආදරයේ උල්පත වූ අම්මා
iii. කඳුළු හෙලා නැඹිලියට
iv. ගමට කලින් හිරු

33. "සමිඳු පාමුල පිදෙන විලසින්" යන ගී පදය අයත් වන හින්දුස්ථානි තාලය වන්නේ
i. ජප් තාලයයි
ii. දීප් චන්දි තාලයයි
iii. ත්‍රිතාලයයි
iv. දාධරා තාලයයි

34. ගීත ප්‍රස්තාරකරණයේදී ග්‍රහ ස්ථාන 3 ක් භාවිත වේ. ඉන් තාලයේ පළමු මාත්‍රාවෙන් පසුව ගීතය ආරම්භ කිරීම
i. සමග්‍රහයයි
ii. අවග්‍රහයයි
iii. විෂම ග්‍රහයයි
iv. යතියයි

35. වයලීන්, ගිටාර්, බටනලා ආදී සංගීත භාණ්ඩවල සාම්ප්‍රදායික හඬ කිසියම් විද්‍යුත් අංකිත ක්‍රමයකට සැකසීම හඳුන්වන්නේ
i. MIDI යනුවෙනි
iii. MOUSE යනුවෙනි
ii. MODEM යනුවෙනි
iv. MONITOR යනුවෙනි

36. විශ්ව සංගීතය පිළිබඳ අවධානය යොමු කිරීමේදී වඩාත් ඵලදායී ලෙස භාවිත කළ හැකි අන්තර්ජාල යෙදවුමකි
i. Windows  ii. Wikipedia  iii. You Tube  iv. Reason

37. වන්නම් සවුදම්, සඳ සාවි මා, ගම අවුලක්ඤං වැනි ගීත නිර්මාණ කළ සංගීතඥයා වන්නේ
i. ඩබ්. බී. මකුලොළුව මහතා
ii. සී. ද එස්. කුලතිලක මහතා
iii. රෝහණ බැද්දගේ මහතා
iv. ලයනල් රංවල මහතා

38. සිංහල සංගීත ශෛලිය, ගම්මානෙන් උපන් ගීත වැනි කෘති රචනා කරන ලද්දේ
i. ලයනල් රංවල මහතා
ii. රෝහණ බැද්දගේ මහතා
iii. සී. ද එස්. කුලතිලක මහතා
iv. ඩබ්. බී. මකුලොළුව මහතා

39. "හරි ප්‍රසාද් චෞරසියා" ප්‍රසිද්ධත්වයට පත් වූ වාදන භාණ්ඩය වන්නේ
i. සිතාරයයි  ii. තබ්ලාවයි  iii. බටනලාවයි  iv. එස්රාජයයි

40. බටහිර ස්වර ප්‍රස්තාරයක තාලය ප්‍රකාශනය වන සංකේතය හඳුන්වන්නේ
i. Intro නමිනි
ii. Scale නමිනි
iii. Bit නමිනි
iv. Time Signature නමිනි